# ත්‍රිකෝන.

එයයි මමයි වැඩ කලේ එකට. එකම මේසේ, මූණට මූණ බලාගෙන. බලාගෙනමත් නෙවෙයි. අපිට කරන්න ගොඩක් වැඩ තිබුනා. උදේ ඉඳන් දවල් වෙනකන් ; දවල් ඉඳන් හවස් වෙනකල් ; සමහරවිට ඊටත් පහුවෙනකන්.

අපි දෙන්නම කලේ එකම විෂයයක වැඩ.

එයා දත්ත රැස් කලා. - ▼

එසොල විරුද්ධ පාර්ශවයේ ඉඳන්

---

එයාට මූහු ණ ලාගෙන

මම ඒවා සාරාංශගත කලා. - △

අපි සහයෝගෙන් වැඩ කලා. - ▼ / △

සහයෝගෙන් දිගටම වැඩ කලා, දිගටම, දිගින් දිටම ...........



එයා හිටිහැටියෙ ......... (ඒක කියන්නෙ කොහොමද කියන එක ප්‍රශ්නයක්) .... ඒ කියන්නෙ .....



"දිල්රුක්ෂි අර ෆයිනල් රිපෝර්ට් එකට කලින් එකේ ඩේටා වල ප්‍රශ්නයක් තිබුනෙ නෑ නේද?"
"...නෑ. ඇයි?"
"...නෑ. නිකං."

මමත් ඒක එච්චර ගනන් ගත්තෙ නැහැ. ඊට කලිනුත් එයා ....



.... වගේ වැඩ කරලා තිබුන නිසා.

අපි (මම ඔන්න ඔහෙ) දිගටම වැඩ කරගෙන ගියා.



හිටිහැටියෙ එයාව වෙනත් අංශයකට මාරු කලා. දවසක් දෙකක් මම ~~තනි~~ 'කම්මැලි'කමේ හිටියා.



"නම මොකද්ද?"
"සැන්ඩ්‍රා."
"▼ පුලුවන්ද?"
"මම ▲ කරන්නද?"
"මට ▽ කරන්න වෙයි!. මෙච්චර කල් කලේ එහෙම නෙමෙයි."
"..............."
"කමක් නෑ එහෙනම්. ▲ කරන්න."
"නෑ මං ▼ කරන්නං"




දිල්රුක්ෂිව ඉඳලා හිටලා හම්බවුනා.

"මොනවද එහෙ කරන්නෙ ▼ ද?"

"ඒවමත් නෙවෙයි. ▶."

"ඒ කියන්නෙ  ද?"

"නෑ.  "

"..............."

".....ඇයි?"

"...නෑ. නිකං."

මම සැන්ඩ්‍රාත් එක්ක වැඩ කරගෙන ගියා.



"සැන්ඩ්‍රාගෙ වැඩ කොහොමද?"
"වරදක් නෑ සර්."
"වැඩ ටික අල්ලගෙන යනවද?"
"ඔව්. එයා තාම අලුත්නෙ. පස්සෙ හරියයි."
"සැන්ඩ්‍රා කොහොමත් වැඩ පුරුදු වෙනකන් විතරයි ඔතන ඉන්නෙ. පස්සෙ ආයි දිල්රුක්ෂිව දාවි."
"ආ. ඒක හොඳයි සර්."
"ඇයි?"

* * *

"සර්, සැන්ඩ්‍රත් එක්ක වැඩකරලා නම් ටාගට්ස් වලට යන්න අමාරු වේවි."
"ඇයි?"
"නෑ සර්, එයා තාම අලුත්නෙ. එක්ස්පීරියන්ස් තියෙන කෙනෙක් හිටියනම්....."
"...හ්ම්"
"දිල්රුක්ෂිව ඉක්මනට ගත්තනම් හරි සර්."
"..හ්ම්....එහෙනම් සැන්ඩ්‍රට ට්‍රේන් වෙන්නත් එක්ක එයාව ගම්මු."

දිල්රුක්ෂි ආයිත් ආවා.



සැන්ඩ්‍රා ටික දවසකින් යන්න ගියා. ....... දිල්රුක්ෂියි, මමයි ආයිත් එකට වැඩ කලා.



ටික දවසකින්. ....



"මොකද මේ වෙලා තියෙන්නෙ?"

"."

"△?"

"△ △ △ △ △"

"මාලක!."

"හරි. හරි. △!."

දිල්රුක්ෂි ඒ වෙලාවෙ මොනවා හිතුවද දන්නෙ නෑ. පස්සෙ මගෙත් එක්ක හොඳට කතාකලා. ඒත් මට අහන් ඉන්න වුවනාවක් තිබුනෙ නෑ.




"ඇයි සද්දයක් නැත්තෙ?"

"..නෑ...මේ △ ."

"ආ ඔව්. ඒක තමා."

* * *

"සර්, අපි දෙන අවුට්පුට් එක ප්‍රඩක්ටිව් මදි නේද?"

"ඇයි?"

"නෑ සර්. අපේ රිපෝට්ස් වල ස්ට්‍රක්චර් එක වෙනස් කලා නම්...."

"ඒ කිව්වෙ?"

"  වෙනුවට  වගේ."

"ම්හ්... එහෙමනම්  ත් වැඩි වෙන්න

"  වගේ?"

"..........."

"  වගේ?"

"තේරුමක් නෑ."

"......  වගේ?"

"......ම්....ඒක නං නරකමත් නෑ."

"ඒක තමා සර්. .......සර් අපි සැන්ඩ්‍රුවත් ගෙන්න ගම්මු. පහුගිය ටිකේ මෙහෙ වැඩ කරලා එයාටත් පුරුදුයිනෙ."

*   *   *

© මාධව වරකාගොඩ. - smwarakagoda@yahoo.com
'රූපාක්ෂර' - 2007.05